**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ**
**மாவட்ட செயலகம் - மாத்தளை**
**DISTRICT SECRETARIAT – MATALE**

කාර්යාලය දුරකථන/தொலைபேசி/ Telephone – 066 2222233
දිසාපති/දිස්ත්‍රික් ලේකම් மாவட்ட செயலாளர் GA/District Secretary – 066 2222235, 066 2222236
නිල නිවස வீடு Residency – 066 2222205
ෆැක්ස් பெக்ஸ் Fax – 066 2226542
වෙබ් අඩවිය இணைய தளம் Web Site – www.matale.dist.gov.lk
විද්‍යුත් තැපෑල ஈ - மெயில் e-mail – moha.dist.matale@gmail.com


මගේ අංකය எனது இல My No. – 1/13/3/4
ඔබේ අංකය உமது இல. Your No –
දිනය திகதி Date – 2018.11. 01

මාතලේ දිස්ත්‍රික්කයේ සියලුම ආයතන ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම 2018/2019</u>**

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් දිස්ත්‍රික්කයේ සේවය කරන සියළුම රාජ්‍ය නිලධාරීන් (මාණ්ඩලික නොවන) සඳහා 2013 වසරේ සිට පරිගණක පුහුණු ඇතුළු විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ 4000කට වැඩි ප්‍රමාණයකට පුහුණුව ලබා දී ඇති බව ඉතා සතුටින් දන්වා සිටිමි.

02. ලබා ගත් අත්දැකීම් හා පුහුණුලාභීන්ගේ යෝජනාවලට අනුව දිස්ත්‍රික් පුහුණු ඒකකයේ කටයුතු ස්ථාපිත කර ඇති නව පුහුණු මධ්‍යස්ථානයේ විධිමත් පුහුණු සැලැස්මකට අනුව 2019 වසරේ සිට නොකඩවා පවත්වාගෙන යාමටත්, ධාරිතා සංවර්ධනය තුළින් දිස්ත්‍රික්කයේ ඵලදායී රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම අපගේ මූලික පරමාර්ථය වේ.

03. ඒ අනුව 2019 වසරේ දිස්ත්‍රික් පුහුණු සැලැස්ම සකස් කිරීම සඳහා නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳ තොරතුරු අප හට අවශ්‍ය වී ඇත. ඔබ අයතනයේ හා උප කාර්යාලවල එක් එක් නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා ආකෘති පත්‍රයක් හා ආකෘති පත්‍රය පිරවීම සඳහා උපදෙස් මේ සමඟ ඉදිරිපත් කරමි. (ආකෘති පත්‍රය පිරවීමට පෙර එය සඳහා ලබා දී ඇති උපදෙස් අනුගමනය කරන්න.)

04. ඒ අනුව එම උපදෙස් පත්‍රිකාවේ සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඔබ ආයතනයේ නිලධාරීන්ගේ පුහුණු අයදුම්පත් අදාළ ආකෘතියට අනුව සම්පූර්ණ කර 2018.11.15 දිනට පෙර මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

05. මීට අමතරව ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වශයෙන් ඔබ ආයතනයේ අභිවෘද්ධියට අත්‍යාවශ්‍ය වේ යැයි හැඟෙන පුහුණු සම්බන්ධ යම් යෝජනා ඇත්නම් ඒ පිළබඳව දන්වා එවන මෙන් වැඩිදුරටත් දන්වමි.

මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එස්.එම්.පී.කේ. පෙරේරා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ.

එස්.එම්.පී.කේ. පෙරේරා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ.